රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 28/99

මගේ අංකය: ආ/III/2/1-6
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය,
කොළඹ-07.

1999 දෙසැම්බර් මස 07 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්.

**<u>1999/2000 රාමසාන් සමයේ දී විශේෂ නිවාඩු ලබාදීම</u>**

මෙවර රාමලාන් (රාමසාන්) සමය 1999 දෙසැම්බර් 10 දින ආරම්භ වී 2000 ජනවාරි 8 දින අවසන් වීමට නියමිත බැවින් එම කාල සීමාව තුළ දී මුස්ලිම් භක්තික නිලධාරීන්ට/සේවකයින්ට යාඥා සහ ආගමික වතාවත්වල නිරත විය හැකි වන පරිදි වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

02. යාඥා හා ආගමික කටයුතු දිනපතා සිදු කෙරෙන කාල වේලාවන් පහත දැක්වෙන පරිදි වේ.

* පෙරවරු 3.30 සිට පෙරවරු 6.00 දක්වා
* පෙරවරු 6.30 සිට පෙරවරු 7.30 දක්වා
* පස්වරු 6.30 සිට පස්වරු 7.30 දක්වා
* පස්වරු 8.30 සිට පස්වරු 10.30 දක්වා

03. හැකි සෑම අවස්ථාවකදීම එම නිලධාරීන්ට/සේවකයන්ට ආගමික වතාවත්වල යෙදීමට හැකිවන පරිදි වැඩමුර සකස් කර දිය යුතුය.නොවැළැක්විය හැකි අවස්ථාවන්වලදී පමණක් විශේෂ නිවාඩු අනුමත කිරීම මැනවි.

04. රාමලාන් (රාමසාන්) අවසන්වීමට දින 14 කට කලින් රාජ්‍ය සේවයේත්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලත් සුදුසුකම් ඇති මුස්ලිම් නිලධාරීන්ට/සේවකයින්ට උත්සව අත්තිකාකරම් මුදල් ලබා දීමට ද කරුණාකර කටයුතු කරන්න.

**මහින්ද බන්දුසේන**
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය